# 7 ශ්‍රේණිය සිංහල -2022

## 11 ඒකකය

# ප්‍රායෝගික ලේඛන




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 11. ප්‍රායෝගික ලේඛන

අපේ ජීවිතයට අදාළව එදිනෙදා කටයුතු සඳහා අපට බොහෝ විට ලිපි ලිවීමට සිදු වෙයි. තොරතුරක් දැනුම් දීමට හෝ තොරතුරක් ලබා ගැනීමට ඇති එක් සන්නිවේදන මාධ්‍යයක් වන්නේ ලියුම් හුවමාරුව යි.



ලියුම්වලට අමතරව ආරාධනා පත්‍ර, දැන්වීම්, අත්පත්‍රිකා, පෝස්ටර් ආදිය ද සන්නිවේදනයේ දී භාවිත වේ. මේ සියල්ල ලේඛනය මගින් කළ යුතු වෙයි.

ඒ නිසා භාෂාව නිවැරදිව හා නිරවුල්ව භාවිත කිරීමත් සුදුසු ආකෘති හා ශිල්පීය ක්‍රම යොදා ගැනීමත් අවශ්‍ය වේ. මේ පාඩමේ දී රාජකාරි ලිපි ලිවීම හා ආරාධනා පත්‍ර සකස් කිරීම පිළිබඳ මග පෙන්වීමක් කෙරෙයි.

## රාජකාරි ලිපි

- *රාජකාරි ලිපි ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු*

  * සංක්ෂිප්ත බව.
  * ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම.
  * පිළිවෙළ, පිරිසිදු බව හා ක්‍රමානුකූල බව රැක ගැනීම.
  * ලිපියේ මාතෘකාවෙන් අන්තර්ගතයේ මූලික අදහස පිළිබිඹු කිරීම.

  * කිව යුතු දේ පැහැදිලිව තීරණය කළ යුතු යි.
  * කිව යුතු දේ ක්‍රමානුකූලව තර්කානුකූලව පෙළ ගැස්විය යුතු ය.
  * එක් මූලික කරුණක් සඳහා එක් ඡේදයක් බැගින් යොදා ගත යුතු ය.
  * කෙටි සරල වාක්‍ය හා වචන භාවිත කළ යුතු ය.
  * විරාම ලක්ෂණ නිසි පරිදි යෙදිය යුතු ය.
  * ලිපියේ ක්‍රමානුකූල බව හා පිරිසිදු බව රැක ගත යුතු ය.

  * ලිපිය කුමන විෂයයක් සම්බන්ධයෙන් දැයි විවෘත කළ විගස කියවන්නාට දැන ගැනීමට හැකි වන ලෙස ලිපියට මාතෘකාවක් යෙදිය යුතු ය.

  * ලිපිය ලබන්නා ලිපිය කියවූ පසු ඒ සම්බන්ධයෙන් කුමක් කළ යුතු දැයි නිශ්චිත ක්‍රියා මාර්ගයකට යොමු කිරීමක් ලිපිය මගින් කළ යුතු ය.

  * ලිපියේ දෙපස තීරුවල අදාළ ඉඩ ප්‍රමාණය තබන්න. (ගොනුගත කිරීමේ පහසුව හා අදාළ සටහන් ආදිය තැබීම සඳහා.)

- **රාජකාරි ලිපියක මූලිකාංග**

  * යවන්නාගේ නම, තනතුර, ලිපිනය, දුරකථන අංකය හා දිනය
  * ලබන්නාගේ තනතුර හා ලිපිනය
  * ආමන්ත්‍රණය
  * මාතෘකාව
  * අදාළ කරුණු
  * අවසානය

**ඇමුණුම 1**

රාජකාරි ලිපියක ආකෘතිය i




**ඇමුණුම 2**

රාජකාරි ලිපියක ආකෘතිය ii




## ඇමුණුම 3

- ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන මදුරු වසංගතය මර්දනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.
- පාසල් චාරිකා කමිටුවේ ලේකම් ඔබ යැයි සිතන්න. මෙවර අධ්‍යාපන චාරිකාව සඳහා කොළඹ පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීමට අදහස් කරන හෙයින් ඒ සඳහා අවසර ඉල්ලමින් ග්‍රහලෝකාගාර අධ්‍යක්ෂතුමා වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.
- 'ජලය සුරකිමු' සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතා ප්‍රදේශයේ ජනතාවට මුහුණ දීමට සිදු ව ඇති පානීය ජල ප්‍රශ්නය විසඳීමට උචිත වැඩ පිළිවෙළක් සකසන ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

**ඇමුණුම 4**

ප්‍රසන්න ජයවීර,
ලේකම්,
"පරිසර මිතුරෝ" සංවිධානය,
පැණිවෙළුරව මහා විද්‍යාලය,
හිඹුටුගොල්ල.
දුරකථන අංකය 098 2243875
2016.01.10

කෘෂි පර්යේෂණ හා සංවර්ධන නිලධාරි,
පැණිවෙළුරව උතුර,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
හිඹුටුගොල්ල.

මහත්මයාණෙනි,

**ආදර්ශ ගොවිපොළක් ආරම්භ කිරීම**

අප පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රායෝගික තාක්ෂණ කුසලතා හා කෘෂිකර්මය යන විෂයයන්ට අදාළව ඉදිරි මාස් කන්නයේ දී පරිසර හිතකාමී ආදර්ශ ගොවිපොළක් ආරම්භ කොට පවත්වා ගෙන යෑමට අදහස් කොට ඇත. මේ සඳහා විදුහල්පතිතුමාගේ පූර්ණ අනුමැතිය ද ලැබී තිබේ.

ඒ අනුව බිම සකස් කර ගැනීම, භෝග තෝරා ගැනීම හා සපයා ගැනීම, භෝග රෝපණය කිරීම හා පොහොර යෙදීම ආදි කරුණු සම්බන්ධයෙන් ඔබතුමාගේ උපදෙස් අපේක්ෂා කරමු. පහසු දිනයක් හා වේලාවක් දුරකථනයෙන් දැනුම් දී පාසලට පැමිණ අපට අවශ්‍ය උපදෙස් සපයන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුති යි,

............................
ලේකම්

............................
සභාපති

# ආරාධනා පත්‍ර

- **ආරාධනා පත්‍ර සකස් කිරීමට සිදු වන අවස්ථා**

  * පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උලෙළ, ත්‍යාග ප්‍රදානෝත්සවය ආදිය
  * පාසලේ වාර්ෂික පිංකම්, උපහාර උත්සව ආදිය
  * පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංග, පිළිගැනීම්, විවෘත කිරීම්, දේශන, සමු ගැනීම්, නාට්‍ය, ප්‍රදර්ශන ආදිය
  * සමිති සමාගම් හා සම්බන්ධ විවිධ අවස්ථා
  * මංගල උත්සව
  * විවිධ ආගමික උත්සව
  * ගෙවැදීම්
  * පවුලේ උත්සව ආදිය

- **ආරාධනා පත්‍රයක අඩංගු විය යුතු මූලික කරුණු**

  * අරමුණ (අවස්ථාව හෝ සිද්ධිය)
  * දිනය
  * වේලාව
  * ස්ථානය
  * ප්‍රධාන ආරාධිතයාගේ නම
  * ආරාධනා කරන්නේ කවු ද?
  * කොහි සිට ද?
  * ආරාධනාව කරන දිනය
  * ලිපිනය

- **ආරාධනා පත්‍ර සැකසීමේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු**

  * නිවැරදි අක්ෂර වින්‍යාසය
  * පැහැදිලි අත් අකුරු
  * සංක්ෂිප්ත බව
  * සිත් ගන්නාසුලු නිමාව
  * නිර්මාණශීලී බව
  * පිළිවෙළ, ක්‍රමානුකූල බව
  * පිරිසිදු බව

**ඇමුණුම 5**

ආරාධනා!

වීරදෙණිය
සුදර්ශි විද්‍යාලයේ

නෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල
විවෘත කිරීම

2015 සැප්තැම්බර් මස 17 වැනි
බදාදා දින පෙ. ව. 10.00 ට

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ
ප්‍රධානත්වයෙන්
සිදු කෙරේ.

එම සුවිශේෂ අවස්ථාවට සහභාගි වන ලෙස
ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට
ගෞරවයෙන් ඇරයුම් කර සිටිමු.

සංවිධායක මණ්ඩලය,
සුදර්ශි විද්‍යාලය,
2015.08.02 වීරදෙණිය.

## ඇමුණුම 6

# ආරාධනා

සඳුන්ගම
රාහුල මධ්‍ය මහා විද්‍යාලයේ
ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උලෙළ
විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයකු වන
බ්‍රිගේඩියර් සාලිය මුදුන්ගොඩ
මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්
2016 ජනවාරි 24 වන දින
පෙ.ව. 10.00ට
විද්‍යාලයීය රැස්වීම් ශාලාවේ දී
අභිමානවත් ලෙස පැවැත්වේ.
එම සුවිශේෂ අවස්ථාවට සහභාගි වන ලෙස
ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට
ගෞරවයෙන් ආරාධනා කරමු.

විදුහල්පති හා සංවිධායක මණ්ඩලය
රාහුල මධ්‍ය මහා විද්‍යාලය
සඳුන්ගම

2016.01.14

### ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා/නායිකාව ලෙස සිතා පාසල් සේවා බස් රථය නිසි වේලාවට ධාවනය නො වීම හේතුවෙන් පාසලට පැමිණීමේ දීත් පාසල අවසානයේ නිවෙස් කරා යෑමේ දීත් ඇති වන කාල ප්‍රමාදය නිසා පාසල් දරුවන් මුහුණ දී ඇති දුෂ්කරතා පැහැදිලි කරමින් එම ගැටලුවට ඉක්මන් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා විදුහල්පතිතුමා මගින් ඩිපෝ අධිකාරිතුමාට යවන රාජකාරි ලිපියක් ලියන්න.

2. ඔබ පාසලේ "පරිසර මිතුරෝ" සංවිධානයේ ලේකම් යැයි සිතා පාසල අසල භූමියකට නගරයේ කැලි කසළ බැහැර කිරීම නිසා සිදු වී ඇති පරිසර දූෂණය හේතුවෙන් පාසල් දරුවන් මුහුණ පා ඇති දුෂ්කරතා පැහැදිලි කරමින් එම ගැටලුවට වහා විසඳුමක් ලබා දෙන ලෙස ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් ලියන්න.

3. ඔබ පාසලේ පැවැත්වීමට නියමිත කවර හෝ උත්සවයක් මුල් කර ගෙන ඒ සඳහා සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වන්නන් වෙත යැවීමට සුදුසු ආකාරයේ නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

- **ප්‍රායෝගික අභ්‍යාස**

1. රාජකාරි ලිපිය

යෙත්මිනි නානායක්කාර,
ප්‍රධාන ශිෂ්‍ය නායිකා,
'ලක්පහන' විදුහල,
දුරකථන අංකය 098 2243875
2022.09.13

ඩිපෝ අධිකාරිතුමා,
කඳාන,
ජා ඇල.

මහත්මයාණෙනි,

පාසල් සේවා බස් රථය නිසි වේලාවට ධාවනය කරවීම පිළිබඳවයි.

අප පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා යොදවා තිබෙන පාසල් සේවා බස් රථය කලක සිට නිසි වේලාවට ධාවනය නො වීම නිසා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාසලට පැමිණීමේ දීත් පාසල අවසානයේ නිවෙස් කරා යෑමේ දීත් විවිධ දුෂ්කරතා මතු වී ඇත.

ඇතැම් දිනවල දරුවන් උදෑසන රැස්වීමෙන් පසුව පාසලට පැමිණෙන අතර මේ නිසා ඔවුන් විවිධ දඬුවම් වලටද ලක් වේ. ඔවුන්ගේ පළමු කාලච්ඡේදය බොහෝ දින වල මගහැරී යන බවද අප ශිෂ්‍ය නායකයින් විසින් කළ සමීක්ෂණයකදී දැන ගන්නට ලැබුණි. තව ද ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිවාස වලට යන විට බොහෝ ප්‍රමාද වන බව ද අප හට දැන ගන්නට ලැබුණු අතර ඇතැම් සිසුන් පාසලේ දී ලබා දෙන ගෙදර වැඩ නොකරන තත්වයක් ද උද්ගත වී ඇත.

ඇති වන කාල ප්‍රමාදය නිසා අප පාසලේ අධ්‍යාපන කටයුතු, ක්‍රීඩා කටයුතු ආදියට ඇති වන බාධාව ද සැලකිල්ලට ගෙන බස් රථය නිසි වේලාවට ධාවනය කරවීමට අවශ්‍ය වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කර දෙන මෙන් ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

.....................................
ප්‍රධාන ශිෂ්‍ය නායිකා

.....................................
විදුහල්පතිතුමා

3. ආරාධනා පත්‍රය

# ආරාධනා

කොළඹ
ආනන්ද විද්‍යාලයේ
වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය
විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයකු වන
ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා
මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්
2022 සැප්තැම්බර් 30 වන දින
පෙ.ව. 10.00ට
විද්‍යාලයීය කුලරත්න ශාලාවේ දී
අභිමානවත් ලෙස පැවැත්වේ.
එම සුවිශේෂ අවස්ථාවට සහභාගි වන ලෙස
ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට
ගෞරවයෙන් ආරාධනා කරමු.

විදුහල්පති හා සංවිධායක මණ්ඩලය
ආනන්ද විද්‍යාලය
2022.09.13 කොළඹ

**ඇමුණුම 7**

- ඔබ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගි වන ලෙස ඉල්ලමින් ආරාධිතයින් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.



නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege

## නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය - 2020**

**සිංහල භාෂාව**

**7 ශ්‍රේණිය**

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**11 - ඒකකය**

## <u>ප්‍රායෝගික ලේඛන</u>

01. පහත කොටුවේ දැක්වෙන පද පේළි හා වාක්‍ය යොදා දී ඇති රාජකාරි ලිපියේ හිස්තැන් පුරවන්න.

මහත්මයාණෙනි, ගිය සතියේ ඩෙංගු රෝගීන් දෙදෙනෙකු '' සුවසෙත සංවිධානය , අපේක්ෂා කරමි.
033 - 2293542 ස්තුතියි , සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය , මහජනතාව වේලාවන්

සුමිත් විජේසිංහ

ලේකම්

(i) ………………….

දූරණියගල.

දුරකථන අංකය (ii) ………………….

2019.08.05

මහජන සෞඛ්‍ය නිලධාරිතුමා,

(iii) ………………….

දූරණියගල.

(iv) ………………….

**මදුරු උවදුර මර්දනය කිරීම.**

දූරණියගල ප්‍රදේශවාසින්ට මදුරුවන් නිසා සෞඛ්‍ය ගැටලු රැසකට මුහුණපෑමට සිදුවී ඇත.

(v) …………………………….. හමුවීමෙන් ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට මෙය බලවත් තර්ජනයක් බව පැහැදිලිය.

මදුරු උවදුර මර්දනය කිරීමට මේ වන විට මහජනතාව දැඩි උනන්දුවකින් පසුවන අතර, ඔවුන් දැනුවත් කිරීමේ සහාය ඔබතුමාගෙන් (vi) …………………………….. ලේ පරීක්ෂා කිරීම මෙන්ම මෙම රෝගයේ අවදානම් තත්ත්වය පිළිබඳ (vii) …………………………….. දැනුවත් කිරීම ද අවශ්‍ය බව පවසන අතර , ඒ සඳහා ඔබතුමාට පහසු දිනයක් හා (viii) …………………………….. දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

(ix) ……………………………..

මෙයට,

විශ්වාසී,

අත්සන

…………………….

ලේකම්

(2) පාසලක ආරාධනා පත්‍ර සකස් කරන අවස්ථා 05ක් නම් කරන්න.

(i) ………………………………………….

(ii) ………………………………………….

(iii) ………………………………………….

(iv) ………………………………………….

(v) ………………………………………….

(3) (i) පෙළ පොතේ සඳහන් ආරාධනා පත්‍රයේ ' අරමුණ ' යනුවෙන් අදහස් කොට ඇත්තේ කුමක් ද ?

………………………………………………………………………………………..

(ii) එහි ප්‍රධාන ආරාධිතයා හඳුන්වා නම ද සඳහන් කරන්න.

………………………………………………………………………………………..

(iii) ආරාධනා කරන්නේ කවුරුන් විසින් ද ?

………………………………………………………………………………………..

(iv) උත්සවය පවත්වන දිනය සඳහන් කරන්න.

………………………………………………………………………………………...

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

# පිළිතුරු



**Answer**

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**
**ඒකක පරීක්ෂණය - 2020**
**සිංහල භාෂාව**
**7 ශ්‍රේණිය**

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

1. සුමිත් විජේසිංහ
   ලේකම්
   "සුවසෙත සංවිධානය"
   දැරණියගල.

   දුරකථන අංකය 033 - 2293542
   2019.08.05

   මහජන සෞඛ්‍ය නිලධාරිතුමා,
   සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය,
   දැරණියගල.

   මහත්මයාණෙනි,

   <u>මදුරු උවදුර මර්දනය කිරීම.</u>

   දැරණියගල ප්‍රදේශවාසින්ට මදුරුවන් නිසා සෞඛ්‍ය ගැටලු රැසකට මුහුණපෑමට සිදුවී ඇත. ගිය සතියේ ඩෙංගු රෝගීන් දෙදෙනෙකු හමුවීමෙන් ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට මෙය බලවත් තර්ජනයක් බව පැහැදිලිය.

   මදුරු උවදුර මර්දනය කිරීමට මේ වන විට මහජනතාව දැඩි උනන්දුවකින් පසුවන අතර, ඔවුන් දැනුවත් කිරීමේ සහාය ඔබතුමාගෙන් අපේක්ෂා කරමි. ලේ පරීක්ෂා කිරීම මෙන්ම මෙම රෝගයේ අවදානම් තත්ත්වය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම ද අවශ්‍ය බව පවසන අතර , ඒ සඳහා ඔබතුමාට පහසු දිනයක් හා වේලාවන් දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

   ස්තූතියි,

   මෙයට,
   විශ්වාසි,



   ..................................
   අත්සන
   ලේකම්

2.

I. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උලෙළ, ත්‍යාග ප්‍රදානෝත්සවය ආදිය
II. පාසලේ වාර්ෂික පිංකම්, උපහාර උත්සව ආදිය
III. පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංග, පිළිගැනීම්, විවෘත කිරීම් ආදිය
IV. පාසලේ පැවැත්වෙන දේශන, සමු ගැනීම්, නාට්‍ය, ප්‍රදර්ශන ආදිය
V. පාසලේ සමිති සමාගම් හා සම්බන්ධ විවිධ අවස්ථා

3.

I. සඳුන්ගම රාහුල මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීමේ උලෙළ
II. බ්‍රිගේඩියර් සාලිය මුදුන්ගොඩ මැතිතුමා
III. සඳුන්ගම රාහුල මධ්‍ය මහා විද්‍යාලය විදුහල්පති හා සංවිධායක මණ්ඩලය
IV. 2016 ජනවාරි 24 වන දින



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ